


**10 ශ්‍රේණිය ගණිතය** **29 වන පාඩම** **සැකසුම : S.V.P.C.ඉමල්ෂා**

**ර/ඇඹි/කොළඹගෙආර මහා විද්‍යාලය**

# පෘෂ්ඨ වර්ගඵලය හා පරිමාව

❖ පහත දී ඇති තල රූපවල පෘෂ්ඨ වර්ගඵලය සොයන්න.

i)




ii)




iii)




iv)




අරය **r** වන වෘත්තයක පෘෂ්ඨ වර්ගඵලය $\pi r^2$ වේ.

❖ පහත වෘත්ත වල පෘෂ්ඨ වර්ගඵලය සොයන්න.($\pi = \frac{22}{7}$)

i)




ii)



iii)




- **ඒකාකාර ඝනවස්තුවක පරිමාව එහි හරස්කඩ වර්ගඵලයේත් උසෙහිත්(දිගෙහිත්) ගුණිතයෙන් ලබා ගත හැකිය.**

**ඒකාකාර ඝනවස්තුවක පරිමාව = හරස්කඩ වර්ගඵලය x දිග(උස)**

- ඒ අනුව පහත ඝනවස්තු වල පරිමාව සොයන්න.

i)




ii)




iii)




හරස්කඩ වර්ගඵලය = $30\ cm^2$

## සෘජු වෘත්ත සිලින්ඩරයක පෘෂ්ඨ වර්ගඵලය




**සෘජු වෘත්තාකාර සිලින්ඩරයක වෘත්තාකාර තල පෘෂ්ඨ දෙකක් සහ වක්‍ර පෘෂ්ඨයක් ඇත.මෙම වක්‍ර පෘෂ්ඨය වෙන් කර දිග හැරිය විටදී එය සෘජුකෝණාස්‍රාකාර හැඩයක් ගනී.**

**ඒ අනුව සිලින්ඩරයේ මුළු පෘෂ්ඨ වර්ගඵලය පහත පරිදි සෙවිය හැකි වේ.**

| සිලින්ඩරයේ මුළු පෘෂ්ඨ වර්ගඵලය | = | ඉහල මුහුණතේ වර්ගඵලය | + | පහල මුහුණතේ වර්ගඵලය | + | වක්‍ර පෘෂ්ඨයේ වර්ගඵලය |
|---|---|---|---|---|---|---|




$$A = \pi r^2 + \pi r^2 + 2\pi rh$$

$$\boxed{A = 2\pi r^2 + 2\pi rh}$$

සටහන:

- **පියන රහිත** සිලින්ඩරාකාර වස්තුවක බාහිර පෘෂ්ඨ වර්ගඵලය $= \pi r^2 + 2\pi rh$ වේ.
- **පියන හා පතුල රහිත** සිලින්ඩරාකාර වස්තුවක, බාහිර පෘෂ්ඨ වර්ගඵලය $= 2\pi rh$ වේ.

### නිදසුන 01

සිලින්ඩරාකාර ටින් එකක පතුලේ අරය 7 cm ද,උස 10 cm වේ.

i) එක් වෘත්තාකාර මුහුණතක වර්ගඵලය

ii) වක්‍ර පෘෂ්ඨයේ වර්ගඵලය

iii) මුළු පෘෂ්ඨ වර්ගඵලය,සොයන්න.




r = 7 cm

i) වෘත්තාකාර මුහුණතක වර්ගඵලය $= \pi r^2$

$= \frac{22}{7} \times 7 \times 7$

$= \underline{\underline{154\ cm^2}}$

ii) වක්‍ර පෘෂ්ඨයේ වර්ගඵලය = $2\pi rh$

$= 2 \times \frac{22}{7} \times 7 \times 10$

$= \underline{\underline{440\ cm^2}}$

Iii) මුළු පෘෂ්ඨ වර්ගඵලය = $2\pi r^2 + 2\pi rh$

$= 2 \times 154 + 440$

$= 308 + 440$

$= \underline{\underline{748\ cm^2}}$

### නිදසුන 02

පියන රහිත සිලින්ඩරාකාර භාජනයක උස 12 cm ද,එහි පතුලේ පරිධිය 88cm ද වේ.

i) පතුලේ අරය සොයන්න.

ii) පෘෂ්ඨ වර්ගඵලය සොයන්න.

**පතුලේ අරය r මගින්ද උස h මගින්ද දක්වමු.**

i) පතුලේ පරිධිය = $2\pi r$

$2\pi r = 88$

$2 \times \frac{22}{7} \times r = 88$

$r = \frac{88 \times 7}{2 \times 22}$

$r = \underline{\underline{14\ cm}}$




ii) පෘෂ්ඨ වර්ගඵලය = $\pi r^2 + 2\pi rh$

$= \frac{22}{7} \times 14 \times 14 + 2 \times \frac{22}{7} \times 14 \times 12$

$= 616\ cm^2 + 1056\ cm^2$

$= \underline{\underline{1672\ cm^2}}$

❖ අභ්‍යාසය

1) සිලින්ඩරයක අරය 14 cm ද උස 20 cm ද නම්

i) වෘත්තාකාර මුහුණතක වර්ගඵලය

ii) වක්‍ර පෘෂ්ඨයේ වර්ගඵලය

iii) මුළු පෘෂ්ඨ වර්ගඵලය,සොයන්න.

2) ලෝහමය සිලින්ඩරාකාර ටින් එකක පතුලේ විෂ්කම්භය 14 cm ද උස 50 cm ද නම් මුළු පෘෂ්ඨ වර්ගඵලය,සොයන්න.

3) පියන රහිත භාජනයක පතුලේ අරය3.5 cm ද උස 5 cm ද නම් පෘෂ්ඨ වර්ගඵලය,සොයන්න

## ත්‍රිකෝණාකාර හරස්කඩක් සහිත සෘජු ප්‍රිස්මයක පෘෂ්ඨ වර්ගඵලය



**ත්‍රිකෝණාකාර හරස්කඩක් සහිත සෘජු ප්‍රිස්මයක ත්‍රිකෝණාකාර මුහුණත් 2ක් සහ සෘජුකෝණාස්‍රාකාර මුහුණත් 3ක් ඇත.ඒවායේ වර්ගඵල වල එකතුව ප්‍රිස්මයේ මුළු පෘෂ්ඨ වර්ගඵලය වේ.**

### නිදසුන 01

පහත දැක්වෙන ප්‍රිස්මයේ මුළු පෘෂ්ඨ වර්ගඵලය,සොයන්න.




BC = 16cm



$$AC^2 = AX^2 + XC^2$$
$$10^2 = AX^2 + 8^2$$
$$100 - 64 = AX^2$$
$$\therefore 36 = AX^2$$
$$\therefore AX = \sqrt{36}$$ (දිගක් සෘණ විය නොහැකි නිසා)
$$\therefore AX = 6\text{ cm}$$

මේ අනුව, $ABC$ ත්‍රිකෝණාකාර මුහුණතේ මුළු වර්ගඵලය $= \frac{1}{2} \times 16\text{ cm} \times 6\text{ cm} = 48\text{ cm}^2$

$\therefore ABC$ හා $PQR$ ත්‍රිකෝණාකාර මුහුණත්වල මුළු වර්ගඵලය $= 2 \times 48\text{ cm}^2 = 96\text{ cm}^2$

$ACRP$ සෘජුකෝණාස්‍රාකාර මුහුණතේ වර්ගඵලය $= 10\text{ cm} \times 30\text{ cm} = 300\text{ cm}^2$

$APQB$ සෘජුකෝණාස්‍රාකාර මුහුණතේ වර්ගඵලය $= 10\text{ cm} \times 30\text{ cm} = 300\text{ cm}^2$

$BCRQ$ සෘජුකෝණාස්‍රාකාර මුහුණතේ වර්ගඵලය $= 16\text{ cm} \times 30\text{ cm} = 480\text{ cm}^2$

$\therefore$ ප්‍රිස්මයේ මුළු පෘෂ්ඨ වර්ගඵලය $= 96 + 300 + 300 + 480$

$= \underline{\underline{1176\text{ cm}^2}}$

❖ අභ්‍යාසය

1) පහත දැක්වෙන එක් එක් ප්‍රිස්මයේ මුළු පෘෂ්ඨ වර්ගඵලය සොයන්න. `




(iv)




(v)




2) පහත දැක්වෙන මිනුම් සහිත පතරොම භාවිත කර සෑදිය හැකි ත්‍රිකෝණාකාර හරස්කඩක් සහිත සෘජු ප්‍රිස්මයේ මුළු පෘෂ්ඨ වර්ගඵලය සොයන්න.



# සිලින්ඩරයක පරිමාව

**ඒකාකාර හරස්කඩක් සහිත සිලින්ඩරයේ හරස්කඩ වර්ගඵලය උසින් ගුණකර පරිමාව ලබා ගත හැකිය.**




වෘත්තාකාර පතුලේ අරය $r$ ද, සෘජු උස $h$ ද වූ සෘජු වෘත්ත සිලින්ඩරයක් සලකමු. එහි පරිමාව $V$ මගින් දක්වමු.

සිලින්ඩරයේ පරිමාව = හරස්කඩ වර්ගඵලය × උස

$= \pi r^2 \times h$

$= \pi r^2 h$

| සිලින්ඩරයේ පරිමාව $(V) = \pi r^2 h$ |
|---|

### නිදසුන 01

අරය 7 cm ද උස 15 cm ද වූ සෘජු වෘත්ත සිලින්ඩරයක පරිමාව සොයන්න.

සිලින්ඩරයේ පරිමාව $= \pi r^2 h$

$= \frac{22}{7} \times 7 \times 7 \times 15$

$= \underline{\underline{2310\ cm^2}}$

❖ අභ්‍යාසය

1) පහත දැක්වෙන එක් එක් සිලින්ඩරයේ පරිමාව සොයන්න

i)




ii)




හරස්කඩ වර්ගඵලය = $500cm^2$

2) සිලින්ඩරාකාර භාජනයක අරය 14 cm වේ.එහි $6160cm^3$ ජල ධාරිතාවක් ඇත්නම් එම භාජනයේ උස සොයන්න.

# ප්‍රිස්මයක පරිමාව




**ඒකාකාර හරස්කඩක් සහිත සෘජු ප්‍රිස්මයක පරිමාව එහි හරස්කඩ වර්ගඵලයේත් උසෙහිත් (දිගෙත්) ගුණිතයට සමාන වේ.**

| ප්‍රිස්මයේ පරිමාව = හරස්කඩ වර්ගඵලය × සෘජු උස (දිග) |
|---|
| $V = A\,l$ |

## නිදසුන 01




රූපයේ දක්වා ඇති දත්ත අනුව ප්‍රිස්මයේ

(i) හරස්කඩ වර්ගඵලය සොයන්න.

(ii) පරිමාව සොයන්න.

(i) හරස්කඩ වර්ගඵලය $= \frac{1}{2} \times 6 \times 8$

$= \underline{\underline{24\ cm^2}}$

(ii) ප්‍රිස්මයේ පරිමාව = හරස්කඩ වර්ගඵලය x උස

$= 24 \times 10$

$= \underline{\underline{240\ cm^3}}$

## නිදසුන 02

ඍජුකෝණික ත්‍රිකෝණාකාර හරස්කඩක් සහිත ප්‍රිස්මයක්

(i) හරස්කඩෙහි $x$ මගින් දක්වා ඇති දිග සොයන්න.

(ii) හරස්කඩ වර්ගඵලය සොයන්න.

(iii) ප්‍රිස්මයේ පරිමාව සොයන්න.




(i) $ABC$ ත්‍රිකෝණයට පයිතගරස් සම්බන්ධය යෙදීමෙන්

$$AC^2 = AB^2 + BC^2$$

$$15^2 = x^2 + 9^2$$

$$225 = x^2 + 81$$

$$225 - 81 = x^2$$

$$\sqrt{144} = x$$

$$x = \underline{\underline{12\text{ cm}}}$$

(ii) හරස්කඩ වර්ගඵලය

$$= \frac{1}{2} \times 9 \times 12$$

$$= \underline{\underline{54\text{ cm}^2}}$$

(iii) ප්‍රිස්මයේ පරිමාව

$$= 54 \times 20$$

$$= \underline{\underline{1\,080\text{ cm}^3}}$$

❖ අභ්‍යාසය

1) පහත දැක්වෙන ප්‍රිස්ම වල පරිමාව සොයන්න

i)




ii)




2) රූපයේ දැක්වෙන ප්‍රිස්මයේ පරිමාව 960 $cm^3$ නම් ප්‍රිස්මයේ දිග සොයන්න.

